# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2156/10 - 2019 දෙසැම්බර් මස 30 වැනි සඳුදා - 2019.12.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/1978(X)(A)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී. බී. 4833 දරන සමාගමක් වන නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද සහ 2018 ජනවාරි මස 11 වැනි දින අංක 2053/40 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය, එහි I වන හා II වන උපලේඛන පරිච්ඡින්න කොට ඒ වෙනුවට පහත දැක්වෙන I වන සහ II වන උපලේඛන ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

**"I වන උපලේඛනය**

***කොන්දේසි***

නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් ආයතනය විසින්, පරිගණක පද්ධති ඉංජිනේරු පිළිබඳ විද්‍යාවේදී ඉංජිනේරු ගෞරව උපාධිය සම්බන්ධයෙන්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධියට අදාළ උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ භෞතික විද්‍යා විෂයය ධාරාවෙන් සාමාන්‍ය සාමාර්ථ ('S') තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

II වන උපලේඛනය

| I වන තීරය<br>උපාධිය | II වන තීරය<br>උපාධිය සඳහා වන කෙටි යෙදුම |
|---|---|
| පරිගණක පද්ධති ඉංජිනේරු පිළිබඳ විද්‍යාවේදී ඉංජිනේරු ගෞරව | බීඑස්සී ඉංජිනේරු (ගෞරව) (පරිගණක පද්ධති ඉංජිනේරු) |

ආචාර්ය බන්දුල ගුණවර්ධන,
උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ
නවෝත්පාදන අමාත්‍ය.

2019 දෙසැම්බර් මස 27 වැනි දින,
කොළඹ දී ය.

01 - 370/1

---

එල්.ඩී.බී. 21/1978(X)(A)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වන වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන වන මා විසින්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති, ලියාපදිංචි අංක පී. බී. 4833 දරන සමාගමක් වන නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් ආයතනය සම්බන්ධයෙන් ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසුව, මෙම නියමය මගින්, එකී පනත යටතේ සාදන ලද සහ 2019 මැයි මස 2 වැනි දින අංක 2121/43 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනය, මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, එහි I වන තීරයේ දක්වෙන ''ජාත්‍යන්තර ව්‍යාපාර පිළිබඳ කළමනාකරණවේදී ගෞරව'' යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිව ම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන සහ II වන තීරයන්හි නිශ්චිතව දක්වා ඇති සටහන් එකතු කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

I වන උපලේඛනය

***කොන්දේසි***

නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් ආයතනය විසින්, විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු පිළිබඳ විද්‍යාවේදී ඉංජිනේරු ගෞරව උපාධිය සහ මෙකාට්‍රොනික් ඉංජිනේරු පිළිබඳ විද්‍යාවේදී ඉංජිනේරු ගෞරව උපාධිය සම්බන්ධයෙන්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධිවලට අදාළ උපාධි පාඨමාලා සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ භෞතික විද්‍යා විෂයය ධාරාවෙන් සාමාන්‍ය සාමාර්ථ (‘S’) තුනක් (3) එකවර ලබා තිබීම හෝ ඒ හා සමාන සුදුසුකමක් ලබා තිබීම යන අවම ඇතුළත් කර ගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

II වන උපලේඛනය

| I වන තීරය<br>උපාධිය | II වන තීරය<br>උපාධිය සඳහා වන කෙටි යෙදුම |
|---|---|
| විද්‍යුත් සහ ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු පිළිබඳ විද්‍යාවේදී ඉංජිනේරු ගෞරව | බීඑස්සී ඉංජිනේරු (ගෞරව) (විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු) |
| මෙකාට්‍රොනික් ඉංජිනේරු පිළිබඳ විද්‍යාවේදී ඉංජිනේරු ගෞරව | බීඑස්සී ඉංජිනේරු (ගෞරව) (මෙකාට්‍රොනික් ඉංජිනේරු) |

ආචාර්ය බන්දුල ගුණවර්ධන,
උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ
නවෝත්පාදන අමාත්‍ය.

2019 දෙසැම්බර් මස 27 වැනි දින,
කොළඹ දී ය.

01 - 370/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.